පාස්කු ඉරිදා ප්‍රහාර පිළිබඳ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කරන ලද ප්‍රකාශය

**2019 අප්‍රේල් 21 ( කොළඹ, ශ්‍රී ලංකා)** - පාස්කු ඉරිදා දිනයේ දී පූජනීය ස්ථාන හා නාගරික හෝටල් වල සිවිල් ජනයා ඉලක්ක කරමින් සිදු කරන ලද ප්‍රහාර ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය තරයේ හෙළා දකියි. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විපතට පත් වූවන් හා එම පවුල් වලට ද රජයට හා ශ්‍රී ලාංකීය ප්‍රජාවටද තම බලවත් ශෝකය ප්‍රකාශ කර සිටින අතර අනතුරට පත් සියලු දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරයි. මෙවැනි ප්‍රහාර ශ්‍රී ලංකා ජනතාව ගේ එක්සත් බව පළුදු කිරීම අරමුණු කරගත් ඒවා වන අතර, නීතියේ ආධිපත්‍යය හා මානව හිමිකම් ආරක්ෂා වන අයුරින් ද, සැමට ආරක්ෂාව තහවුරු වන ලෙස කටයුතු කරන මෙන් සියලු බලධාරීන්ගෙන් හා සියලු පුරවැසියන්ගෙන් එක්සත් ජාතීන් දැඩිව ඉල්ලා සිටියි.